සිංහල පරිවර්තනය

## උතුරු පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2020

උතුරු පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පහත සඳහන්, **I වන වගුවේ** දක්වා ඇති තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බව නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **18.12.2020** වේ.

**I වන වගුව**

| විභාගයේ නම | තනතුරු අංකය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2020 | **01** | **24** |
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2020 | **02** | |
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සහකාර (කෘෂිකර්ම ව්‍යාප්තිය) සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2020 | **03** | **85** |

### 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද **I වන වගුවේ** දක්වා ඇති තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය/ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් කර ඇති කොන්දේසීන්, ආයතන සංග්‍රහයේ විධිවිධානය ද, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817/30 හා 2013.07.03 වන දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් පළ කරන ලද උතුරු රාජ්‍ය සේවයට අයත් ආයතන කාර්ය පටිපාටි සංග්‍රහය ද යනාදීන්ට අනුකූලව තෝරා ගනු ලබන විභාග අපේක්ෂකයන් **I වන වගුවේ** දක්වා ඇති තනතුරුවල III වන ශ්‍රේණියට (කෘෂිකර්ම උපදේශක) පත් කරනු ලැබේ.

02.2 තරඟ විභාගයෙන් III වන ශ්‍රේණියට සමත් වූ විභාග අපේක්ෂන් පත්වීම් ලබන දින සිට වසර තුනක (03) ක සේවා කාලයක් පරිවාස කාලයට යටත් කොට III වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි උක්ත තනතුරු වල III වන ශ්‍රේණියට පත් කර ගන්නා දින සිට වසර තුනක (03) ක කාලය තුළ දී පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

**02.3** කෘෂිකර්ම උපදේශක **III** වන ශ්‍රේණියට සෘජුවම බඳවා ගනු ලබන අතර බඳවා ගැනීමේ ශ්‍රේණිය වන කෘෂිකර්ම උපදේශක **III** වන ශ්‍රේණියට සෘජුවම බඳවා ගැනීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. තරඟ විභාගයෙන් සමත් වන විභාග අපේක්ෂකයන්, පුරප්පාඩු වලින් 30% ක සීමාව තුළ කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. බඳවා ගනු ලබන අභ්‍යාසලාභීන් පුහුණු කාලයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම පුහුණු විද්‍යාලයක වසර දෙකක් හා මාසය හයක කාල සීමාවක ඩිප්ලෝමා විභාගයෙන් සමත් විය යුතුයි. මෙම කාල පරිච්ඡේදය තුළ මෙම පත්වීම්ලාභීන්ට මාසික ප්‍රතිපාදනයක් වශයෙන් අධ්‍යාපන නිවාඩු ප්‍රදානය කරනු ලැබේ. **කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට අදාළ පත්වීම්ලාභීන් පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත පත්වීමට අදාළ කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව හදාරා සම්පූර්ණ කළ යුතුයි.**

02.4 මෙම සේවය ස්ථානමාරු සහිත සේවයක් වන අතර පත්වීම සඳහා තෝරාගන්නා අපේක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා එම නියෝගයට යටත්විය යුතුයි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා එයට අනුකූලව වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛයන් ප්‍රකාර පත්වීම් දින සිට වසර පහක් (05) ක් අවසන් වීමට ප්‍රථම නියම කරන ලද දෙවන රාජ්‍ය භාෂාවට ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව හා ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් තිර්වචනය කරනු ලැබේ. පත්කිරීමට නියමිත ගණන **I වන වගුවේ** සඳහන් පරිදි වේ. එනමුත් නිවේදනය කර ඇති පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03 වැටුප් පරිමාණය :-

### 03.1 කෘෂිකර්ම උපදේශක III වන ශ්‍රේණියට

රාජ්‍ය පරිපාලන චක්‍රලේක අංක *03/2016* ප්‍රකාර, වැටුප් කාණ්ඩය, **MN 3 - 2016** ප්‍රකාර කෘෂිකර්ම උපදේශක සේවයේ **III** වන ශ්‍රේණියට ශුද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ රුපියල් **31, 040 – 10 x 445 - 11 x 660 - 10 x 730 – 10 x 750 – 57, 550/- කි**. (රුපියල් 32,375 යන වැටුප් පියවරට ප්‍රථම 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි) කෙසේ වුවද ඉහත චක්‍රලේඛය ප්‍රකාර එහි **උපලේඛන – II** හි සඳහන් විධිවිධානයන්ට අනුව වැටුප් ගෙවනු ලැබේ.

### 03.2 කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට

රාජ්‍ය පරිපාලන චක්‍රලේක අංක 03/2016 චක්‍රලේඛයේ **උපලේඛන V** හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව මාසික වැටුප් හා ගැලපුම් දීමනා ගෙවනු ලැබේ.

1 වන වර්ෂයේ - රුපා **27,140.00**

2 වන වර්ෂයේ - රුපා **27,440.00**

### 03.3 තාක්ෂණ සහකාර (කෘෂිකර්ම ව්‍යාප්තිය) III වන ශ්‍රේණියට

රාජ්‍ය පරිපාලන චක්‍රලේක අංක 03/2016 ප්‍රකාර, වැටුප් කාණ්ඩය **MT 1 - 2016** ප්‍රකාර තාක්ෂණ සහකාර (කෘෂිකර්ම ව්‍යාප්තිය) සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට ශුද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ රුපියල් **29, 840 – 10 x 300 - 11 x 350 - 10 x 560 – 10 x 660 – 48,890/-කි**. (රුපියල් 30,740 යන වැටුප් පියවරට ප්‍රථම 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි) කෙසේ වුවද ඉහත චක්‍රලේඛය ප්‍රකාර එහි **උපලේඛන – II** හි සඳහන් විධිවිධානයන්ට අනුව වැටුප් ගෙවනු ලැබේ.

## 04 සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවක කිරීමට යෝග්‍ය වන පරිදි ශාරීරික නිරෝගිතාවයකින් යුත් පුද්ගලයකු විය යුතුයි එමෙන්ම මනා චරිතයකින් හෙබි පුද්ගලයකු ද විය යුතුයි.

04.3 අ) අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු අතර මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම වසර හයක (06) කාල පරිච්ඡේදයෙන් අවම වශයෙන් වසර තුනක්වත් (03) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවකු විය යුතුයි.

**හෝ**

ආ) අයදුම්කරුගේ හෝ දෙමාපියන්ගේ උපන් ස්ථානය උතුරු පළාත විය යුතු අතර අවම වශයෙන් වසර පහත් වත් *(05)* උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි **(*සම්මුඛ පරීක්ෂණයේ දී ජන්ද නාම ලේඛණයෙන් උපුටාගත් සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත භාරගන්නා අවසාන දිනට **(18.12.2020)** හෝ ඊට ප්‍රථම මෙම තනතුරු සඳහා කැඳවා ඇති **සියළුම සුදුසුකම්** අපේක්ෂකයා විසින් සපුරා තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

### 05.1 කෘෂිකර්ම උපදේශක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට:- (තනතුරු අංක – 01)

**අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස(සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ/සිංහල/ඉංග්‍රීසි) ගණිතය හා විද්‍යාව යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) විශිෂ්ඨ සාමාර්ථයන් ද සමග විෂයයන් හයක්(06) සමත්වී සිටිය යුතුයි.

**ඒ සමගම**

අ.පො.ස(උ/පෙ) විභාගයෙන් විද්‍යා අංශයෙන් ජීවවිද්‍යාව, රසායන විද්‍යාව හා කෘෂිකර්ම විද්‍යාව /භෞතික විද්‍යාව යන විෂයයන් ගෙන් කුමක් හෝ එක් විෂයක් ඇතුළුව විෂයයන් තුනක් (03) **එකවර** සමත්වී තිබිය යුතුයි

**හෝ**

අ.පො.ස(උ/පෙ) විභාගයෙන් ජීවන පද්ධති තාක්ෂණ අංශයෙන් පහත සඳහන් විෂයයන් තුන්කින් (03) **එකවර** සමත්වී තිබිය යුතුයි

- ජීවන පද්ධති තාක්ෂණය
- තාක්ෂණවේදි විද්‍යාව
- කෘෂිකර්ම විද්‍යාව

**ඒ සමඟ**

**ආ) වෘත්තීය සුදුසුකම් :-**

1. කුණ්ඩසාලේ, අගුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වවුනියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයකින් වසර දෙකක(02) කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකයක් හිමි කර තිබිය යුතුයි.

**හෝ**

අම්පාර හාඩි තාක්ෂණ ආයතනයෙන් තාක්ෂණ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකයක් හිමි කර තිබිය යුතුයි.

**හෝ**

ඇක්වයිනස් (Aquinas) විද්‍යාලයේ වසර දෙකක (02) කෘෂිකර්ම ඩිප්ලෝමාව හදාර තිබිය යුතුයි.

**හෝ**

2. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා උක්ත තාක්ෂණ සහතික ප්‍රදානය කරන ආයතනවලින් උපදෙස් ලබාගත් පසු අවශ්‍ය නම් ඉහත තාක්ෂණවේදී සුදුසුකම් වලට සෑම ආකාරයෙන්ම සමාන වූ තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ අනුමත කරන ලද වෙනත් තාක්ෂණ සුදුසුකම්.

**හෝ**

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පහත සඳහන් උපාධින් අතරින් ලබා ගත් ප්‍රාථමික උපාධියක්.
   - අ. කෘෂිකර්ම විද්‍යා උපාධිය [B.Sc (Agriculture)]
   - ආ. කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණ විද්‍යා උපාධිය [B.Sc (Agriculture Technology and Management)]
   - ඇ. අපනයන කෘෂිකර්මාන්ත විද්‍යා උපාධිය [B.Sc (Export Agriculture)]
   - ඇ. ගොවිපළ හා රබර් තාක්ෂණ විද්‍යා උපාධිය [B.Sc (Palm and Latex Technology)]

**ඇ) වයස් සීමාව :-**

අයදුම්පත්‍රය භාරගන්නා අවසාන දිනට අපේක්ෂකයාගේ වයස **අවුරුදු 18 නොඅඩු**, **අවුරුදු 30 නොවැඩි** විය යුතුයි.

## 05.2 කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණියට :-

**(තනතුරු අංක – 02)**

**අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස(සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව හෝ සාහිත්‍ය (දෙමළ/සිංහල/ඉංග්‍රීසි) ගණිතය හා විද්‍යාව යන්, විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) විශිෂ්ඨ සාමාර්ථයන් ද සමඟ විෂයයන් හයක්(06) සමත්වී සිටිය යුතුයි.

**ඒ සමඟම**

අ.පො.ස(උ/පෙ) විභාගයෙන් ජීවවිද්‍යාව, රසායනික විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව,/භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් ඇතුළුව එකවර විෂයයන් තුනක් (03) සමත්වී තිබිය යුතුයි

**අල්ලතු**

- අ.පො.ස(උ/පෙ) විභාගයෙන් ජීවන පද්ධති තාක්ෂණ අංශයෙන් පහත සඳහන් විෂයයන් තුන්කින් (03) **එකවර** සමත්වී තිබිය යුතුයි
    - ජීවන පද්ධති තාක්ෂණය
    - තාක්ෂණවේදී විද්‍යාව விஞ்ஞானம்
    - කෘෂිකර්ම විද්‍යාව

**ආ) වයස් සීමාව :-**

අයදුම්පත්‍රය භාරගන්නා අවසාන දිනට අපේක්ෂකයන්ගේ **වයස අවුරුදු 18** නොඅඩු හා **අවුරුදු 30 ට** නොවැඩි විය යුතුයි.

**05.3 තාක්ෂණ සහකාර (කෘෂිකර්ම ව්‍යාප්තිය) III වන ශ්‍රේණියේ තනතුරට :-**

**(තනතුරු අංක – 03)**

**අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස(සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාරවල** භාෂාව හෝ සාහිත්‍ය (දෙමළ/සිංහල/ඉංග්‍රීසි), ගණිතය යන, විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) විශිෂ්ඨ සාමාර්ථයන් ද සමග විෂයයන් හයක්(06) සමත්වී සිටිය යුතුයි. මෙයින් එකවර නම් අවම වශයෙන් විෂයයන් පහත් සමත් වී තිබිය යුතු යි.

**ඒ සමග**

**ආ) වෘත්තීය සුදුසුකම් :-**

1. රජය විසින් අනුමත කරන ලද ආයතනයකින් වසර දෙකක කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකපත් සුදුසුකම හිමි කර තිබිය යුතුයි.

**හෝ**

2. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 01/2012 දරණ චක්‍රලේඛය ප්‍රකාර මෙම තනතුරට ගැළපෙන ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 05(NVQ Level – 05) තාක්ෂණ සහතිකය සුදුසුකමක් සේ ලබා තිබිය යුතුයි.

**හෝ**

3. ඉහත තාක්ෂණ සුදුසුකම් වලට සාමාන වන තෘතියික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් හෝ අනුමත කරන ලද වෙනත් තාක්ෂණ සුදුසුකම්.

**ඇ) වයස් සීමාව:-**

අයදුම්පත්‍රය භාරගන්නා අවසාන දිනට අපේක්ෂකයන්ගේ **වයස අවුරුදු 18** නොඅඩු හා **අවුරුදු 35 ට** නොවැඩි විය යුතුයි.

## 06 බඳවා ගැනීමේ ක්‍රමවේදය:-

06.1 ලිඛිත විභාගයක් මගින් කුසලතාව පදනම් කරගෙන, බඳවා ගන්නා අවස්ථාවේදී බලගැන්වී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පටිපාටින්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදින් පරිදි **I වන වගුවේ** සඳහන් තනතුරුවලට බඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මගින් කැඳවන ලද සියළු සුදුසුකම් හා ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ. මෙහි දී ලකුණු කිසිවක් ප්‍රදානය කරනු නොලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බවට නිරීක්ෂණය වන අවස්ථාවක දී මෙම තනතුර සඳහා හිමි අයිතීන් සියල්ල අහෝසි කරනු ලැබේ.

**06.2** ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන්, ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් **ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයෙන් පළාත් මට්ටමින් ලබාගත් වැඩි ලකුණු පිළිවෙල අනුව, පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ප්‍රදානය කිරීමට සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලැබේ.**

06.3 කෘෂිකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වන ශ්‍රේණියට බඳවා ගැනීමට සුදුසුකම් ලබන අපේක්ෂකයන් ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී පමණක් **පුහුණු ශ්‍රේණියට** බඳවා ගැනීම සම්බන්ධයෙන් තීරණය කරනු ලැබේ. පවතින පුරප්පාඩු වලින් 30% සීමාව තුළ පුහුණු ශ්‍රේණියට බඳවා ගන්නා අපේක්ෂකයන්ගෙන් පූර්ණය කරනු ලැබේ.

06.4 පුරප්පාඩුවලින් 03% ක් විශේෂ අවශ්‍යතාවයන් (ආබාධිත) ඇති අපේක්ෂකයන් සඳහා වෙන්කරනු ලැබේ. විභාග අපේක්ෂකයන් පත්වීම සඳහා තෝරාපත් කරගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීමට තම විශේෂ අවශ්‍යතාවය (Disability) බාධාවක් නොවන බවට වෛද්‍ය පරීක්ෂණ වාර්තා මගින් සනාථ කළ යුතුයි. එසේ නමුත් විශේෂ අවශ්‍යතාවයකින් යුත් අපේක්ෂකයකු පත්වීම සඳහා සුදුසුකම් ලබන්නේ ලිඛිත පරීක්ෂණයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමේ පදනම මතයි.

## 07. විභාග ගාස්තු :-

අයදුම්කරුවන් තමන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් වටිනා මුදල **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන තැන්පත් ගිණුමට තැන්පත් කර කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවීම් කරනු නොලැබේ එමෙන්ම මෙම ගාස්තුව වෙනත් විභාගයන් සඳහා මාරු කර ගැනීමට අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කරන ක්‍රමවේදය :-

08.1 මෙම දැන්වීම මඟින් දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (සෙ.මී21 X 29සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා වූ ඡේද පළමු පිටුවේද 11 සිට 14 දක්වා වූ ඡේදයන් දෙවන පිටුවේ ද, අනෙක් කොටස් අනෙක් පිටුවට ද ඇතුලත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **18.12.2020**වන දිනට හෝ ඊට ප්‍රථම, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක :393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුයි.

08.2 එක් තනතුරකට අමතර තනතුරුවලට අයදුම් කිරීමට මනාප වන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර විභාග ගාස්තු ද එක් එක් තනතුරු සඳහා වෙන වෙනම ගෙවීමට වගබලා ගත යුතුයි. මුදල් ගෙවන ලද කුවිතාන්සිය එම අයදුම්පත් සමඟ යොමු කළ යුතුයි.

08.3 අයදුම්පත / අයදුම්පත්‍ර යොමු කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ තමා **අයදුම් කරන තනතුරු නාමය** සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ නිසි පරිදි තොරතුරු සපයා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.4 අයදුම්පත්‍රයේ ඡායා පිටපත තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පත්‍රයේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත යනාදිය පිළිගන්නේ නැති අතර විභාග ප්‍රවේශපත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් යථා කාලයේදී එවනු ලැබේ. **විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම මගින් අයදුම්කරු අවශ්‍ය සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැලකිල්ලට ගත යුතුයි.**

08.5 අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සුදුසුකම් සම්පූර්ණ කර ඇති අපේක්ෂකයන්ට විභාග ප්‍රවේශ පත්‍ර යොමු කරනු ලැබේ. එම ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව ඒ බවට නිවේදනයක් ද නිකුත් කරනු ලැබේ. නිවේදනය නිකුත් කළ පසු යම්කිසි විභාග අපේක්ෂකයකුට විභාග දිනට අවම වශයෙන් දින තුනකට (03) ප්‍රථමයෙන් ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම්, ප්‍රවේශ පත්‍ර නොලැබුණු බව දන්වා පහත සඳහන් තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කොවිල් වීදිය, නල්ලූර්, යාපනය්"** යන ලිපිනයට දැන්වීමට පියවරගත යුතුයි.( දුරකථන අංකය *–021 221 9939*, ෆැක්ස් අංකය *-021 221 9940)*

*08.6*

**ඉදිරිපත් කළ යුතු ලියකියවිලි :-**

**ආවරණ ලිපියක්, අයදුම්පත්‍රයේ ජයාපිටපත, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත, ප්‍රවේශපත්‍ර යොමු කිරීම සඳහා ෆැක්ස් අංකය.**

විභාගයට අයදුම්පත් ඉදිරිපත් කරන විභාග අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ලැබුණු බවට කිසිදු දැනුම් දීමක් නොකරන අතර අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම කැඳවා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නැති අයදුම්පත් ද පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 09. අනන්‍යතාවය ඔප්පු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයකටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් කුමක් හෝ එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි.

(i) පුද්ගලයින් ලියාපදිංචි කරන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු ගුවන් ගමන් බලපත්‍රය.

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත දක්වා ඇති ලියකියවිලිවලින් කුමක් හෝ එකක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් විභාගයට පෙනී සිටීමේ හිමිකම අහිමි කිරීමේ බලය **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත,"** විසින් තම අභිමතය පරිදි සිදු කළ හැකිය. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නියම කරන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

## 10. අසත්‍ය තොරතුරු සඳහා අඩුවම්:-

අයදුම්පත් සම්පූර්ණ කරන විට දැඩි අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලාගත යුතුයි. මෙම විභාගයේ නීතිරීති වලට අනුව කිසියම් අයදුම්කරුවකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී. හෝ විභාගය අවසන් වූ පසුව හෝ සුදුසුකම් නැති අයකු බවට තහවුරු වුවහොත් ඔහුට හිමි විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරුවකු සපයා ඇති කුමක් හෝ තොරතුරක් අසත්‍ය බවට පත්වීම් ලබා දීමෙන් පසු තහවුරු වුවහොත් පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පියවර ගනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්යයි.** රජයේ ආයතනයකින් අයදුම් කරන අයදුම්කරු තම අත්සන ආයතන ප්‍රධානියා මඟින් හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධරයකු ලවා අත්සන සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි, සාමවිනිසුරු, දිවුරුම් ප්‍රකාශක නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුධහමුදා, ගුවන් හමුදාවන්හි නියෝගලත් නිලධරයකු, රුපියල් 498,960.00 ට නොඅඩු වටිනාකමක් ඇති වාර්ෂික වැටුපක් ලබන ස්ථිර රජයේ නිලධරයකු හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධරයකු, ආගමික නිකායන් භාරව කටයුතු කරන පූජක පක්ෂය යනා අයගෙන් කෙනෙකු සහතික කර ගත යුතුයි .

## 12. විභාග සැලැස්ම :-

මෙම ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින්(02) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව නොලැබේ. එක් එක් තනතුර සඳහා විෂයමාලාව පහත සඳහන් පරිදි වේ.

### 12.1 කෘෂිකර්ම උපදේශක III වන ශ්‍රේණියට හා පුහුණු ශ්‍රේණියට :-

| අංකය | විෂය පථය | විෂය මාලාව | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය විවේචනාත්මක හැකියාව විශ්ලේෂණ ක්‍රමය හා බැඳී හැකියාව තීරණය ගැනීමේ හැකියාව තීරණයකට ළඟා වන ආකාරය සංඛ්‍යා, භාෂා හා හැඩ ව්‍යුහය යනාදිය අතර ඇති සම්බන්ධය හා ප්‍රශ්නවලට මුහුණු දිය යුතු ආකාරය කරුණු කෙරෙහි විභාග අපේක්ෂකයාගේ හැකියා මට්ටම මැනීමේ ප්‍රශ්න අඩංගු ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 02 | තාක්ෂණික පර්යේෂණ පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය කෘෂිකර්මය සම්බන්ධ නව නිපයුම් කෙරෙහි ඇති නැඹුරුවාව හා ප්‍රශ්න නිරාකරණය කිරීමේ හැකියාව යන කරුණු කෙරෙහි අයදුම්කරුගේ දැනුම මැනීමේ ප්‍රශ්න වලින් යුත් ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

### 12.2 තාක්ෂණ සහකාර (කෘෂිකර්ම ව්‍යාප්තිය) III වන ශ්‍රේණියේ තනතුරට :-

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | සම්පූර්ණ ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය විවේචනාත්මක හැකියාව විශ්ලේෂණ ක්‍රමය හා බැඳී හැකියාව තීරණය කිරීමේ හැකියාව යනාදිය උරගා බැලීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | සාමාන්‍ය දැනුම (තනතුර හා සබැඳි තාක්ෂණය හා විෂය හාසබැඳි දැනුම) | මෙම ප්‍රශ්නපත්‍රය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට කෘෂිකර්ම අංශයේ දායකත්වය, ශ්‍රී ලංකාවේ දේශගුණය ජලය සම්බන්ධ දැනුම, පස් හා ශාක පෝෂණය, වී නිෂ්පාදනය, වෙනත් ආහාර වර්ගවල බෝග, එළවළු නිෂ්පාදනය, පළතුරු, බෝග වල ආරක්ෂාව, පසේ රසායනිකත්වය, ජල නිර්මාණය හා එහි වැදගත්කම, තාක්ෂණ ගොවිපළ, මීමැසි පාලනය, ශාක නිෂ්පාදනය බිම් සකස් කිරීම, බෝග වගාවේ ආරක්ෂාව, සත්ව නිෂ්පාදනය, කෘෂිකර්ම ව්‍යාප්තිය, තන්තු වර්ධනය, ශාක ආරක්ෂක පනත, ශාක ආරක්ෂක ජීවවිද්‍යාත්මක තාක්ෂණය, කෘෂි සංවර්ධන හා වාරිමාර්ග හා ජල කළමනාකරණය යන කරුණු සම්බන්ධයෙන් අයදුම්කරුගේ දැනුම මැන බැලීමේ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

**සටහන** :-

මෙම විභාගය ලිඛිත පරීක්ෂණයක් වන බැවින් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා වෙන් කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතලිහක ප්‍රතිශතයක් (40%) විභාග අපේක්ෂකයන් ලබා ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් කුසලතා අනුපිළිවෙළ(Merit Order) සැළකිල්ලට ගනු ලැබේ.

## 13. විභාග ප්‍රතිඵල :-

විභාග අපේක්ෂකයන් සඳහා විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභා අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. පසුව විභාගයට පෙනී සිටි විභාග අපේක්ෂකයන් සියල්ලන්ටම තැපැල් මගින් යොමු කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතුය. මෙම නිවේදනයේ දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් අතර යම් කිසි අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක දී දෙමළ මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

***එස්. තිරුවාකරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.
18.11.2020